# පශු හා ධීවර නිෂ්පාදන

ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධානම ප්‍රශ්නයක් වන මන්දපෝෂණය දුරු කළමෙහිලා බොහෝ සෙයින් ආධාර වන සත්ත්ව ප්‍රෝටීන ලබා දීමේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස පශු හා ධීවර නිෂ්පාදනයන් සැලකිය හැකියි. මෙයට ආධාර වන සත්ත්ව පාලනය අපේ රටේ ආර්ථික සංවර්ධනයටද ඉමහත් රුකුලක් වේ. විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා අප සතු ගැමි සම්පත් සීමාවීම නිසා, කුඩා ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට එය මහත් සේ ආධාර වෙයි.

එමෙම කරුණු මත 'සත්ව පාලන' හා ධීවර කර්මාන්තයේ 'විශේෂ වර්ධනයක' අවශ්‍යතාව හඳුනාගත හැකිය. තම නිෂ්පාදන අවශ්‍ය ප්‍රමාණයට නිෂ්පාදනය නොවුවත්, නිෂ්පාදනය කරන ප්‍රමාණය ඉතා ප්‍රශස්ත මට්ටමකින් පාරිභෝගිකයාට ලබා දිය යුතුය. මේ සඳහා මූලික වශයෙන් වැදගත් වන්නේ මේ සම්බන්ධීත 'අලෙවිකරණ' ක්‍රියාවලියයි. සත්ව හා ධීවර නිෂ්පාදන වලින් විශාල ප්‍රමාණයක් එනම් කිරි, මස්, බිත්තර සහ මාළු වර්ග ඉතා ක්ෂණික නරක්වන සුළු සහ විනාශවන නිෂ්පාදන ගනයට අයත් වන හෙයින් ඒ සඳහා ක්‍රියාකාරී ඉක්මන් සහ නවීන තාක්ෂණික හා විද්‍යාත්මක පහසුකම් වලින් යුත් අලෙවිකරණ ක්‍රියාවලියක් අවශ්‍ය බව පෙන්වා දෙයි. මේ අනුව ඉක්මණින් නරක්වන හා විනාශවන සුළු ආහාර භාණ්ඩවල අලෙවි කරණ ක්‍රියාවලියක් රඳා පවතින්නේත්, සාර්ථක වන්නේත්, පහත සඳහන් පහසුකම් සහ ක්‍රියාකාරීකම් ලබා ගැනීමට ඇති හැකියාවන් අනුවය.

(1) ශීතකරණ සහිත ගබඩා පහසුකම් සහ අයිස් නිෂ්පාදනයන් පහසුකම්.

(2) විවිධ ප්‍රදේශවල, පශු හා ධීවර නිෂ්පාදන, ඉල්ලුම් සැපයුම් හා මිල තත්ව යන් පිළිබඳ නිවැරදි සහ කඩිනම් තොරතුරු සැපයීම.

(3) දියුණු කිරීම සහිත 'නිෂ්පාදන සංවර්ධන සහ ව්‍යාප්ති ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(4) අවශ්‍ය පාරිභෝගිකයන්ට "පශු නිෂ්පාදන" ලබා ගැනීමට සෘජු අලෙවි



කරණ ක්‍රියාවලියක් තිබීම.

(5) ප්‍රවාහණ පහසුකම්.

(6) විශාල වශයෙන් අපනයන වෙළඳපල සහ බැඳී තිබීමත් සත්ව නිෂ්පාදන වලින් අතුරු නිෂ්පාදන සකස් කිරීමේ හැකියාවක් තිබීම.

පහල ආදායම් තත්වය, අඩු ඉතිරි කිරීම් හා ප්‍රාග්ධන හිඟකම, සේවා වියුක්තිය හා ඌණ සේවා නියුක්තිය හා ඉඩම් හිඟකම වැනි ආර්ථික ප්‍රශ්ණ වලින් යුතු මෙම අංශ සංවර්ධනය උදෙසා සත්ව පාලන යෝජනා ක්‍රම මහත්සේ ආධාර කර ගත හැකිය. ශ්‍රී ලංකාව වැනි කුඩා රටකට සත්ව පාලන අංශයකින් ලබාගත හැකි ප්‍රයෝජනවත් භාවය සහ යෝග්‍ය භාවය මෙසේ සංක්ෂිප්ත කල හැකිය.

(1) සත්ව පාලන කටයුතු සඳහා අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය ඉතාමත් සුළුය. (උදාහරණ වශයෙන් කුකුල් පාලනය හා එළුවන් ඇති කිරීම.) සාමාන්‍ය බිත්තර දමන කිකිළියන් 100 ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය වර්ග අඩි 200 ක තරම් භූමියකි. එසේම වැඩුනු එළුවෙකු සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 8 - 10 පමණ වෙයි.)

(2) සත්ව පාලන ව්‍යාපෘතියක් ඇරඹීම සඳහා අවශ්‍ය වන මූළ ප්‍රාග්ධන ප්‍රමාණය ඉතා සුළුය. (උදාහරණ වශයෙන් මස් පිණිස මාසයකට 100 ක් අලෙවි කරන කුකුල් ගොවිපලක මූළ ප්‍රාග්ධන වියදම රුපියල් 9000 ක් පමණ වේ.)

(3) සත්ව පාලන ව්‍යාපෘතීන් මගින් ඉතා ඉක්මණින් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වීම. (උදාහරණ වශයෙන් මස් සඳහා ඇති කරන කුකුල් පාලන කර්මාන්තයෙකින් සති 3 - 6 කදී ආයෝජන ප්‍රතිලාභ ලැබිය හැකිය. එසේම බිත්තර දමන කිකිලියන්ගෙන් සති 20 - 22 ක්ද, එළුවන් සහ ඌරු පාලනයෙන් මාස 8 - 9 ඇතුලතද සැලකිය යුතු නිෂ්පාදනයක් ලබා ගත හැකි අතර ඉපදී මාස 18 - 19 එළදෙනෙකු ගෙන් දිනකට කිරි ලීටර් 3.3 බැගින් ලබා ගත හැකිය.)

(4) ඕනෑම සත්ව පාලන ව්‍යාපෘතියක් ඉතාම කුඩා පරිමාණ ව්‍යාපෘතියක්

ලෙස ආරම්භ කර පසුව ක්‍රමානුකූලව පුළුල් කරමින් විශාල ප්‍රමාණ මට්ටමකට ලබා කර දීමට හැකිකම පවතී.

(5) සත්ව පාලන ගොවිපලක් ක්‍රමානුකූලව සැලසුම් කිරීමෙන් අඛණ්ඩව ලැබෙන නිෂ්පාදනයක් සහ වර්ෂය පුරාම හොඳ ආදායම් ප්‍රමාණයක් ඇති කර ගත හැකිය. මේ අනුව මස් පිණිස ඇති කරන කුකුළන් 200 ක් හෝ බිත්තර පිණිස ඇති කරන කිකිළියන් 400 ක් හෝ, ඌරන් 4 දෙනෙකු හෝ ගව දෙනුන් 4 - 5 ක් හෝ එළු දෙනුන් 10 - 15 ක් හෝ සිටින ව්‍යාපෘතියක් මාසිකව අලෙවි කිරීමේ ක්‍රමයකට සැලසුම් කලහොත් එම ව්‍යාපෘතියකින් මාසිකව රුපියල් 2200 ක් 3000 අතර ශුද්ධ ලාභයක් සහිත ආදායමක් ලැබිය හැකිය.

(6) සත්ව පාලනය හා ධීවර කර්මාන්තය මගින් විශාල පිරිසකට රැකියා සැපයීමට හැකි අතර නිෂ්පාදනය වැඩි කිරීමෙන් වැඩි වන ජනගහණයට අනුකූලව අවශ්‍ය ආහාර නිෂ්පාදනය වැඩි වන ආකාරයකට වර්ධනය කල හැකිය.

(7) සාමාන්‍යයෙන් ආහාර ද්‍රව්‍යය සඳහා වෙළඳපලේ පවතින ඉල්ලුම අනම්‍ය ස්වරූපයක් ගන්නා අතර එය නිතරම වර්ධනය වන ස්වරූපයක් පෙන්නුම් කරයි. රටක ආදායම් මට්ටම ඉහල යාමේදී අඩු පෝෂ්‍යය පදාර්ථ වලින් යුත් ආහාර වලින් ඉහල පෝෂ්‍යය පදාර්ථ සහිත ආහාර වර්ග වලට ආදේශනය වීමක් සිදුවේ. මේ තත්වය මත පශු හා ධීවර නිෂ්පාදන සඳහා සංවිධානාත්මක අලෙවි කරණ ක්‍රියාවලියක් තුල ඉතා හොඳ වර්ධනය වන වෙළඳපල ශක්‍යතාවයක් තිබේ. එම නිසා ශ්‍රී ලංකාව වැනි රටවල මෙම නිෂ්පාදනයන් සඳහා හොඳ ලාභ අනුපාතිකයක් සමග වැඩි ආදායමක් ලබා ගත හැකි වෙළඳපලක් ඇතිකර ගත හැකිය.

කෘෂිකාර්මික අතිරික්ත නිෂ්පාදන ද්‍රව්‍ය වලට වඩා සත්ව පාලන ව්‍යාපෘති වලින් ඉතා හොඳ මූල්‍ය ලාභ දායිකත්වයක් ලබාගත හැකිය.

දිවයිනේ සත්ව පාලන කටයුතු දිවයින පුරාම එකම සමානුපාතයෙන පැතිර නොපවතින අතර ඇතැම් සත්ව පාලන කටයුතු විශේෂිත ප්‍රදේශ වලට සීමාවී ඇත. සත්ව පාලනය සහ කිරි පට්ටි පාලනය මෙන් නොව ඌරු පාලනය බටහිර වෙරළබඩ පටු බිම් තීරයකට සීමා වී ඇත. එසේම එළු හා ඌරු වර්ග වැනි පශු සම්පත් වලින් විශාල කොටසක් යාපනය දිස්ත්‍රික්කයට සීමා වී ඇති අතර කුකුළු පාලනයෙන් 60% ක් පමණ සිදු වෙන්නේ බටහිර වෙරළබඩ පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශ වලය. එයට අමතරව මහනුවර, යාපනය සහ ගාල්ල යන ප්‍රදේශද කුකුළු පාලන කර්මාන්තයෙන් ඉදිරියෙන් සිටී. එළු සහ මී ගව පාලනයෙන් වැඩි ප්‍රමාණයක් වියලි කලාපය ආශ්‍රිතව පැතිර ඇති අතර කුරුණෑගල, අනුරාධපුරය, වවුනියාව, මඩකලපුව, අම්පාර වැනි දිස්ත්‍රික්ක එයින් වඩාත් වැදගත් වේ. මේ ප්‍රදේශවල ගව පාලනය බහුල වශයෙන් යොදා ගන්නේ පශු නිෂ්පාදන කාර්යය වලට වඩා බර ඇදීම, සීසෑම වැනි කටයුතු වලටය. එළු පාලනයෙන් 60% ක්ම වියලි කලාපයේ සිදුවන අතර ඌරන් සංඛ්‍යා

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

ටී. ඒ. ධර්මරත්න

විසිනි

වෙන් 75% ක්ම පුත්තලම, කුරුණෑගල, කෑගල්ල යන දිස්ත්‍රික්ක වලට සීමා වෙයි. සත්ව පාලන කටයුතුවල ව්‍යාප්තියේ මෑතකදී ඇතිවී තිබෙන මූලික ප්‍රවනතාවයක් නම් එය විශේෂයෙන්ම පොල් ත්‍රිකෝණය ආශ්‍රිත පොල් වගා බිම්වල ප්‍රධාන අතිරේක ආර්ථික කටයුත්තක් වීමය. මේ ප්‍රදේශයේ දැනට මූලික වශයෙන් කුකුළු පාලනය සහ කිරි සඳහා ගව පාලනය ප්‍රධාන වී ඇති අතර රටට අවශ්‍ය සත්ව නිෂ්පාදන වලින් විශාල ප්‍රමාණයක් මේ ප්‍රදේශ වල නිෂ්පාදනය කරයි. විශේෂයෙන්ම බිත්තර සහ කිරි නිෂ්පාදනය අතින් මේ ප්‍රදේශය විශේෂ දියුණුවක් ලබාගෙන ඇත. මෑතකදී පොල් ත්‍රිකෝණයේ ඇති පුද්ගලික අංශයේ විශාල පරිමාණයේ ආයෝජනයන්, මේ සංවර්ධනයට හේතු වී ඇත. ඒ අනුව, නෙස්ලේ, මිල්කෝ වැනි සමාගම් මගින් මේ ප්‍රදේශයේ කිරි අලෙවිකරණ කටයුතු ක්‍රමානුකූලව කිරීමට උත්සාහ දරා ඇති අතර ඒවායේ නිෂ්පාදන වර්ධනයටද විවිධ පියවරවල් රාශියක් ගෙන ඇත. ඊට අමතරව මේ ප්‍රදේශවල කිරි නිපද

මන්නන් විසින් සංවිධානය වී පිහිටුවාගෙන ඇති කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මගින් ඉටු වන කාර්ය භාරයද මේ වර්ධනයට **ඉවහල් වී තිබේ.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල සත්ව නිෂ්පාදනයන් සැපයුමෙහි විශාල හිඟයක් පවතී. පසුගිය වර්ෂවල බිත්තර සහ කිරි නිෂ්පාදනය හැරුණු විට අනිකුත් පශු හා ධීවර නිෂ්පාදනවල වර්ධන උපනතියක් නොවීය. මෙයට මූලික හේතුව වූයේ පසුගිය වසර කීපයේ මුළුල්ලේ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවැති අහිතකර වාතාවරණයයි.

සත්ව පාලනය දියුණු කිරීම එහි නිෂ්පාදන අලෙවියත් සමග එකිනෙකට සම්බන්ධ වී ඇත. දිනකට එක් පුද්ගලයෙකුගේ කිරි පරිභෝජනය අවුන්ස 1·5 කටත් අඩු නිසා පිරිසිදු එළකිරි වලට හොඳ ඉල්ලුමක් නැත. සම්මත මට්ටමේදී නම් කිරි දියර අවුන්ස 5·5 ක් ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයෙකුට අවශ්‍යය හෙයින් එම ප්‍රමාණයට කිරි පරිභෝජනය වර්ධනය කල හොත් මෙරට නිෂ්පාදිත එළකිරි සඳහා හොඳ ඉල්ලුමක් ඇති කළ හැකිය. 1986 වන විට දේශීය කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 178 ක් බව සංඛ්‍යා ලේඛණ පෙන්වා දෙයි. මෙම නිෂ්පාදන ප්‍රමාණය රටේ කිරි අවශ්‍යතාවයන් සපුරාලීමට කිසිසේත් ප්‍රමාණවත් නොවේ. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය සහ අලෙවිකරණය ආශ්‍රිත සාමාන්‍ය ස්වරූපය පහත සඳහන් ආකාරයට සංක්ෂිප්තව පෙන්වා දිය හැකිය. වත්මන් ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය රාජ්‍ය අංශයේ විශාල සත්ව ගොවි පලවල් කීපයක් හැර සම්පූර්ණයෙන්ම පුද්ගලික අංශයේ ආයෝජනයන් යටතේ පවත්නා අතර එය, කුඩා එළදෙනෙක් ඇති කරන ගව පාලකයෙකුගේ සිට විශාල පරිමාණ ආයෝජනයක් ඇති විශාල කිරි පට්ටි දක්වා පැතිරී යයි. කිරි පට්ටි ඇරඹීම, කිරි දෙවීම, කිරි එකතු කිරීම, මිල කිරීම, සකස් සහ නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීම සහ වෙළඳපලට ඉදිරිපත් කිරීම දක්වා ක්‍රියාකාරීත්වයන් පාලනය වන්නේ සම්පූර්ණයෙන්ම පාහේ ජාත්‍යන්තර බහු ජාතික සමාගම් දක්වා විහිදී ඇති සබඳතාවයන් රැසක් මගිනි. මේ අනුව ලංකාවේ කිරි නිෂ්පාදන අලෙවිකරනය කුඩා වෙළෙන්දෙකුගේ සිට ජාත්‍යන්තර සමාගම් දක්වා දිවෙන ක්‍රියාකාරීත්වයක් දැකිය හැකිය.

කිරි පට්ටි සංවර්ධන ක්‍රියාවලියේදී මූලික අවස්ථා 2 ක් අපට හඳුනා ගත හැකිය. එනම්,

1. මූළ නිෂ්පාදන ක්‍රියාවලියෙන් 70% ක් අයත් කර ගන්නා ගවයින් ඇති දැඩි කරමේ සිට කිරි දොවන අවස්ථාව දක්වා.

11. නිෂ්පාදන ක්‍රියාවලියෙන් 30% ක් අයත් කර ගන්නා කිරි දෙවීම, කිරි එකතු කිරීම, බෝතල් කිරීම, අතුරු නිෂ්පාදනය කිරීම, ඇසුරුම් කිරීම සහ අලෙවි කිරීම් යන කටයුතු දක්වා.

ශ්‍රී ලංකාවේ මෙම කිරි නිෂ්පාදන ක්‍රියාවලියෙන් 30% ක් අයත් කර ගන්නා අලෙවි කරන හා සැකසුම් ක්‍රියාවලිය එතරම් දියුණු මට්ටමකට සකස් වී නැත. මුල් කාලයේදී මෙම ක්‍රියාවලිය රාජ්‍ය අංශය මගින්, ජාතික කිරි මණ්ඩලය ඇරඹීමෙන් දියුණු කිරීමට උත්සාහ ගත් අතර දැන් එම අංශය සම්පූර්ණයෙන්ම පුද්ගලික අංශයේ සමාගම්වල ක්‍රියාකාරිත්වයට යොමු කර ඇත. ශ්‍රී ලංකාවේ කිරි ආහාර හා කිරි පරිභෝජනය වඩාත් ප්‍රබල ලෙසින් පුද්ගලයන්ගේ ආදායම් මත රඳා පවතී. කිරි සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය හා පරිභෝජනය කරන ප්‍රමාණය දේශීය නිෂ්පාදනය කරන ප්‍රමාණයට වඩා ඉතා ඉහල අගයක් ගනී. එම නිසා විශාල ප්‍රමාණයක කිරි ආහාර ද්‍රව්‍යය මෙරටට ආනයනය කිරීමට සිදුවී ඇත. මේ අනුව වාර්ෂිකව කිරි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන ටොන් 12 000 ක් පමණ ආනයනය කර අතර 1984 වර්ෂයේ එහි වටිනාකම රුපියල් කෝටි 65 ක් පමණ විය.

රටේ පරිභෝජනය කරන අනිකුත් සත්ව නිෂ්පාදනයන් අතර මස් හා බිත්තර ප්‍රධාන වෙයි. මස් සඳහා මෙරටට ප්‍රමාණවත් හා සැලකිය යුතු වර්ධන ප්‍රවනතාවයක් පසුගිය වර්ෂ කීපය මුළුල්ලේ සිදු නොවූ බව මස් නිෂ්පාදන සංඛ්‍යා සටහන් පෙන්වා දෙයි. මස් පරිභෝජනයෙන් වැඩි කොටසක් අයත් වන්නේ ගවමස් පරිභෝජනයටයි. එසේම ඌරු හා එළුමස් මිල, ගවමස් මිලට වඩා වැඩි වටිනාකමක් පෙන්නුම් කරන ලදී. බොහෝ බටහිර යුරෝපීය රටවල ගවමස් ඉතා මිල අධික ආහාරයක් වුවත් ලංකාවේ තත්වය එයට වෙනස් විය. එම රටවල කුකුල් මස් මිල අඩු අතර එය සාමාන්‍ය පරිභෝජන ආහාරයක් විය. එසේ වුවත් ලංකාවේ කුකුල් මස් මිල පසු ගිය කාලයේදී වැඩි වටිනාකමක් පෙන්නුම් කලත් දැන් එම මිලට වඩා ගව මස් මිල ඉහල යන ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි. මෑත කාලයේදී ගවමස් කිලෝ එකක් රුපියල් 35-40ක් වූ අතර එළුමස් කිලෝ එකක මිල රුපියල් 60-75 දක්වා වැඩි වී තිබුණි. මස් නිෂ්පාදනයට

ප්‍රධාන බාධකය වූයේ මස් සඳහා සතුන් ඇති කරන ප්‍රදේශවල ඇතිවූ අහිතකරවූ වාතාවරණයයි. එසේ වුවත් කුකුල් මස් නිෂ්පාදනය පොදුවේ අනික් වර්ගවලට වඩා සැලකිය යුතු දියුණුවක් ඇති විය. විශේෂයෙන්ම දිවයිනේ බටහිර ප්‍රදේශවල ඇති වූ කුකුල් පාලන කටයුතුවල දියුණුව නිසා කුකුල් මස නිෂ්පාදනය දියුණු විය. මීට අමතරව පුද්ගලික අංශයේ විශාල පරිමාණ ගොවිපලවල කුකුල් මස් නිෂ්පාදනය සීග්‍රයෙන් වැඩි වූ අතර එය සාමාන්‍ය ජනතාව අතර පරිභෝජන භාණ්ඩයක් බවට පත් විය. එනම් මෙතෙක් කල් සුඛෝපභෝගී ආහාරයක් ලෙසට පැවැති කුකුල් මස් පරිභෝජනය එම තත්වයෙන් වෙනස් විය. මෙයට මූලික හේතුව වූයේ නිෂ්පාදනයෙහි ඇති වූ වර්ධනයයි. මේ කර්මාන්තයේ වර්ධනයට වඩාත් බලපෑ තවත් හේතුවක් වූයේ පුද්ගලික අංශයේ විශාල ගොවිපලවල කුකුල් මස් සකස් කිරීමේ සහ ශීතකරණ සහිත ගබඩා පහසුකම්වල ඇතිවූ දියුණුවයි. 1983 වන විට දිවයිනේ කුකුල් මස් නිෂ්පාදනය ටොන් දහස් 11 ක් පමණ විය. කෙසේ නමුත් පසුගිය වසර කීපයේම දේශීය පරිභෝජන මස් වර්ගවල මිලේ පොදු උපනතිය වූයේ එහි අඛණ්ඩ වැඩිවීමයි. කිලෝ එකක් සඳහා පැවැති මිල රුපියල්

| | මස් වර්ගය | 1980 | 1981 | 1982 | 1983 | 1984 | 1985 |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගවමස් | - 13.27 | 15·40 | 16.81 | 19.12 | 21·19 | 23·46 |
| 2 | එළු මස් | - 25.49 | 28·04 | 31·57 | 37.83 | 42·56 | 46·41 |
| 3 | ඌරු මස් | - 16·52 | 18.81 | 23·76 | 27.52 | 30·56 | 32·47 |
| 4 | කුකුල් මස් | - 27.12 | 28.37 | 34·11 | 39·80 | 42.95 | 45·31 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව.

සාමාන්‍යයෙන් දිවයිනේ මස් මිල තීරණය වෙළඳපල ඉල්ලුම්, සැපයුම් බලවේග මත සිදු වෙයි.

පශු නිෂ්පාදන වලින් මෑත කාලයේදී ඉතා වැදගත් ලෙසන් පුළුල් වී ගියේ බිත්තර වෙළඳපලයි. දැනට වාර්ෂික බිත්තර නිෂ්පාදනය දස ලක්ෂ 600 කටත් වඩා අධික වන අතර විශේෂයෙන්ම බිත්තර නිෂ්පාදනය පසුගිය වර්ෂ 5 ක කාලයේදී සීග්‍රයෙන් වර්ධනය වී ඇත. මේ හේතුව නිසා කුකුල් පාලන ක්ෂේත්‍රය වඩාත් පුළුල් වී ගිය අතර, එය තුල ප්‍රධාන නිෂ්පාදන ක්ෂේත්‍ර දෙකක් විය. එනම් කුඩා පරිමාණ ගොවිපල අංශය සහ මහා පරිමාන ගොවිපල් අංශය හෙවත් වෙළඳ නිෂ්පාදන අංශයයි. මේ කුඩා පරිමාණ ගොවිපල අංශය හෙවත් සම්ප්‍රදායි නිෂ්පාදන අංශය මුළු නිෂ්පාදන ප්‍රමාණයෙන් 40% කට පමණ දායක වන අතර විශාල පරිමාණ අංශය මුළු නිෂ්පාදනයෙන් 60% ක් නිපදවයි. විශාල පරිමාණ කුකුල් ගොවිපල අංශය පසුගිය වර්ෂ 7 ක කාලයේදී දිවයිනේ බටහිර වෙරළබඩ පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශවල සීග්‍රයෙන් පැතිරී ගියහ. බිත්තර වෙළඳාමද, පුද්ගලික අංශය මගින් සම්පූර්ණයෙන්ම පාහේ සිදුවන අතර මුල් කාලයේදී එය එනම් 1980 දී පමණ, රාජ්‍ය අංශයෙන්, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මේ කාර්යයට පිවිසුනහ. එහිදී අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ වෙළඳපලට සපයන මුළු ප්‍රමාණයෙන් 16% ක් පමණ ඉදිරිපත් කළ අතර ඉතිරි කොටස පුද්ගලික වෙළෙඳුන් විසින් සපයන ලදී. 1987 වන විට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව වෙළඳපලට ඉදිරිපත් කරන ලද ප්‍රමාණය 5% ක පමණ මට්ටමකට අඩු වී ඇත. මේ ආකාරයට රාජ්‍ය අංශය බිත්තර වෙළඳාම සම්බන්ධ දරන වැදගත්කම අඩු වී යාමත් සමග අලෙවි කරන මාර්ගවල පැහැදිලි වෙනස් වීමක් දක්නට ලැබේ. එනම් 1980 පමණ දී බිත්තර වෙළඳාම සම්පූර්ණයෙන්ම අතර මැදියන් එක් වී කොළඹ බිත්තර තොග වෙළඳපල මගින් සිදුවිය. නමුත් වර්තමානයේ විශාල ගොවිපල හිමියන් තොග වෙළඳපලට බිත්තර ඉදිරිපත් නොකර, නැතහොත් අතර මැදියන් අතරට පත් නොකර, කෙලින්ම විශාල වශයෙන් පරිභෝජනයට අවශ්‍ය සංචාරක හෝටල්, රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු වැනි ආයතනත්, රෝහල්, ආපන ශාලා, බේකරි ආදී විශාල අවශ්‍යතාවන්ගෙන් යුත් ආයතනත් සමග සෘජු අලෙවිකරණ සම්බන්ධකම් පවත්වාගෙන, ඒවාට ඉදිරිපත් කරයි. එසේ වුවත් කුඩා ගොවිපල හිමියන්ගේ නිෂ්පාදන අතරමැදියන් සහ එකතු කර විකුණන්නන් මගින් තොග වෙළඳපලට ඉදිරිපත් කරයි. කෙසේ නමුත් බිත්තර නිෂ්පාදනය සීඝ්‍ර වර්ධනයකට යොමු වුවත් එහි මිල ගණන් වල පිරිහීමක් මෑත කාලයේදී ඇති විනි. එනම් විශාල වශයෙන් නිෂ්පාදන තොග වෙළඳපලට පැමිණීම නිසා බිත්තර මිල 1987 ජනවාරි සිට ජූලි මාසය දක්වා සීග්‍රයෙන් පහල වැටුණි. දැනට සාමාන්‍ය බිත්තරයක් සඳහා යන නිෂ්පාදන පිරිවැය මිල රුපියල් 1.03 පමණ වෙයි එසේ වත් මේ මිල අඩවීම යටතේ බිත්තරයක සිල්ලර මිල ශත 90 - 80 දක්වා පහල වැටුනි. මේ නිසා සුළු පරිමාණ ගොවිපල නිෂ්පාදකයින් විශාල අසීරු තත්වයකට පත් වයේ තම නිෂ්පාදනවල නිෂ්පාදන පිරිවැයවත් පියවා ගැනී

ට නොහැකි වූ නිසාය. මේ තත්වය නිසා ඇතැම් විට විශාල ප්‍රමාණ ගොවපල නිෂ්පාදන අංශයට, තම නිෂ්පාදන පිරිවැය [illegible] හැකියාවක් ඇත. මෙම නිසා [illegible] ප්‍රමාණ අංශයට එම තත්ත්වයට පත් වීමට නොහැකි වුවත් නිසා අනාගතයේ දී මෙම අවාසිදායක ධීගටම පැවතුනොත් සුළු නිෂ්පාදනයා මෙම කර්මාන්තයෙන් ඉවතට වැටී යාමට හැකි අතර වෙනත් ගැටළු ගණයක් ඇති විය හැකිය.

ශ්‍රී ලංකාවේ පශු නිෂ්පාදන කටයුතු වලට වඩා සැහෙන පමණ දියුණුවක් ධීවර නිෂ්පාදන අංශය ලබා ගෙන ඇත. විශේෂයෙන්ම පශු නිෂ්පාදන වලට වඩා ධීවර නිෂ්පාදනය විදේශීය වෙළඳපලට සම්බන්ධ වී තිබීම මෙයට එක් ප්‍රධාන හේතුවක් වී ඇත. එමෙන්ම දේශීය නිෂ්පාදන මහ ජනතාවගේ ආහාර වේලක අවශ්‍ය අංගයක් බැවින් මේ සඳහා හොඳ ඉල්ලුමක් නිතරම පවතී. අනික් අතට මේ සඳහා සැහෙන දියුණු පාදක ව්‍යුහයක් ගොඩ නගා ඇත. එසේම ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර ඇත. තවද විශේෂයෙන්ම පශු සම්පත් සංවර්ධනයට වඩා දිවයිනේ ධීවර කර්මාන්තයට උචිත භෞතික පරිසරයක් සකස් වී ඇති හෙයින් ධීවර නිෂ්පාදනයක් රටට ලබාගත හැකි වී ඇත. එසේම ඒ අංශය තුල යෙදී සිටින සේවක ප්‍රමාණයද අධිකය. කෙසේ නමුත් ධීවර කර්මාන්තය තුල අනික් නිෂ්පාදන අංශවලට වඩා තරමක සංවිධානාත්මක අලෙවිකරණයක් ගොඩ නැගී ඇත. කොළඹ ප්‍රධාන කොට ගත් තොග වෙළඳපලක් සහිත දිවයින පුරාම විහිදී ගිය ජලාකාර අලෙවිකරණ රටාවකින් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයන් සම්බන්ධ වී ඇත. ධීවර වෙළඳපලේ මෑත කාලීන ප්‍රධාන උපනතියක් වූයේ නිෂ්පාදන ප්‍රමාණයන්ගේ අඩු වීමත් මිල ගණන්වල අඛණ්ඩ ඉහල යාමත්ය. නිෂ්පාදනය අඩුවීමට මූලික හේතුව වූයේ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවැති අහිතකර වාතාවරණයයි. මේ නිසාම සැපයුම් ප්‍රමාණය අඩු වූ අතර, එය හේතු කොට ගෙන මිල ඉහල ගියේය.

කොළඹ අවට ප්‍රධාන නාගරික මාළු වෙළඳසැල්වල පැවැති සාමාන්‍ය මිල ගණන් (රුපියල් කිලෝ එකක් සඳහා)

| මාළු වර්ග | 1984 | 1985 | 1986 |
| --- | --- | --- | --- |
| සාලයා | 13.74 | 17·52 | 19.73 |
| හුරුල්ලා | 20·31 | 23·66 | 26.22 |
| බලයා | 34.36 | 34·30 | 35·43 |
| කෙලවල්ලා | 39·06 | 38.80 | 39·13 |
| තෝරා | 56·78 | 70.74 | 75·64 |
| පරව් | 49.90 | 50·25 | 53.31 |
| මෝරා | 29.03 | 33·56 | 35·27 |

මූලාශ්‍රය - ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකරණ ආයතනය.

පශු හා නිෂ්පාදන ක්ෂේත්‍රයේ අලෙවිකරණ ගැටලු කීපයක් මෙසේ සංක්ෂිප්තව පෙන්වා දිය හැකිය.

(1) පශු හා ධීවර නිෂ්පාදන ඉතා ඉක්මණින් නරක් වන සුළු හා විනාශ වන හෙයින් ඒවා ඉතා ක්ෂණිකව පරිභෝජනයට ගත යුතුය. නැතහොත් ඒවා කල් තබා ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ශීතකරණ ගබඩා පහසුකම් තිබිය යුතුය. ශ්‍රී ලංකාවේ ඒ සඳහා ඇති ගබඩා කිරීමේ පහසුකම් ඉතා දුර්වල මට්ටමක පවතී.

(2) පශු හා ධීවර නිෂ්පාදන මගින් නිපදවිය හැකි අතුරු නිෂ්පාදන රාශියක් වන අතර විවිධාංගීකරණය කිරීම, ඇසුරුම් කිරීම හෝ වෙනත් සැකසුම් කිරීමේ හැකියාවත් ලංකාවේ ඉතා දුර්වල තත්ත්වයක පවතී. මස් සකස් කිරීම, කිරි මගින් නිපදවන අතුරු නිෂ්පාදනයන් ආදිය ඉතා පහත් මට්ටමක ඇති හෙයින් මෙම අංශයේ සංවර්ධනයක් ඇති කල යුතුය.

(3) පශු හා ධීවර නිෂ්පාදන සම්බන්ධ 'මිල ප්‍රතිපත්තියක්' රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක නොවේ. මේ නිසා නිෂ්පාදකයා මෙන්ම පාරිභෝගිකයාද අලාභ විඳී. එහෙයින් මේ අංශයේ නිෂ්පාදන දිරිමත් කිරීමට මිල ප්‍රතිපත්තිය මගින් විශාල කාර්ය භාරයක් ඉටු කර ගත හැකිය.

(4) දිවයිනේ පශු හා ධීවර නිෂ්පාදන ප්‍රදේශ ප්‍රධාන ජනාකීර්ණ ප්‍රදේශවලින් විට ඈත පිහිටා ඇත. එබැවින් එම නිෂ්පාදන නාගරික ප්‍රදේශයන් සඳහා 'ප්‍රවාහනය කිරීම' එතරම් සතුටුදායක මට්ටමක නැත. තවමත් පවතින සම්ප්‍රදායික ක්‍රම මගින් ප්‍රවාහනය කරන අතර දියුණු තාක්ෂණික උපකරණ යොදාගෙන නැත. මේ නිසා ප්‍රවාහනයේදී සිදුවන 'විනාශය හා අපතේ යාම' ඉතා වැඩිවේ. මේ නිසා මේ වැනි නිෂ්පාදන ද්‍රව්‍යයන් ප්‍රවාහනය සඳහා නව ශීතකරන පහසුකම් සහිත රථවාහන වලින් යුත් ප්‍රවාහන සේවයක අවශ්‍යතාවය කැපී පෙනෙයි.

(5) රට තුල ජනතාව සත්ව ප්‍රෝටීන් ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් පශු හා ධීවර නිෂ්පාදනය. පරිභෝජනය කරන ප්‍රමාණය වැඩි කිරීමේ ව්‍යාපෘති ඇති කිරීමෙන් පරිභෝජන මට්ටම ඉහල නැංවීමට සැලසුම් සම්පාදනය කිරීම සහ ඒ මගින් ඉල්ලුම් ප්‍රමාණය වැඩි කර නිෂ්පාදනයද දිරිමත් කල හැකිය.